සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2020 ජූලි

## (303) මූල්‍ය පාලනයන් සහ විගණනය

(Financial Controls & Audit)

2020-10-03
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

සමාගමක අයිතිකරුවන් එම සමාගම කළමනාකරණය කරන තැනැත්තන්ගෙන් වෙනස්වන විට යහපත් සංයුක්ත පාලනය (good corporate governance) සැමවිටම වැදගත් වේ. සංයුක්ත පාලනයේ සියලුම ආකාරයේ පොදු මූලධර්ම කොටස්හිමියන්ට, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට සහ අනෙකුත් ඇල්මැති පාර්ශවයන්ට (stakeholders) සාමාන්‍යයෙන් සම්බන්ධ වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංයුක්ත පාලනයේ මූලධර්ම දෙකක්(02) **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(b) සංයුක්ත පාලනය සඳහා වූ යහපත් පරිචයන් අඩංගු සංග්‍රහයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව පිළිබඳව අඩංගු කර ඇති මඟපෙන්වීම් තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## 02 වන ප්‍රශ්නය

විදුලි උපකරණ ආනයනය කර විකිණීමේ නිරතවී සිටින **සීමාසහිත ඇල්ෆා (පෞද්ගලික) සමාගමේ** ගණකාධිකාරීවරයා ඔබ වේ. ප්‍රධාන වශයෙන් කෝවිඩ්-19 (COVID-19) වසංගතය නිසා පසුගිය කාර්තු දෙක තුළ සැලකිය යුතු අලාභයක් දැරීමට ව්‍යාපාරයට සිදුවිය. අවදානම් විශ්ලේෂණ වාර්තාවක් පිළියෙල කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය ඔබගෙන් ඉල්ලා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත ඇල්ෆා (පෞද්ගලික) සමාගම** මුහුණපා ඇති බාහිර අවදානම් තුනක්(03) සහ අභ්‍යන්තර අවදානම් දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

මූල්‍ය තොරතුරු පරිශීලකයන් හට එම තොරතුරු සාධාරණ අන්දමට නිවැරදිව සහ නිසි ආකාරයට පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවට විශ්වාසයක් ගොඩනැංවීමෙහිලා සහතිකවීමේ කාර්යභාරයන්, කටයුතු කරනු ලබයි. සහතිකවීමේ කාර්යභාරයක එක් මූලිකාංගයක් වන්නේ පාර්ශවයන් තුනකගේ සම්බන්ධතාවයයි (three party relationship).

**ඔබ විසින් කළ යුතු දෑ:**

සහතිකවීමේ කාර්යභාරයක් සම්බන්ධයෙන් පාර්ශව තුනේ සම්බන්ධතාවය **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

තත්ත්වපාලන ක්‍රියාපටිපාටි ආයතනික මට්ටමින් සහ තනි තනි විගණන මට්ටමින් ස්ථාපිත කළ යුතුය. සෑම තනි තනි විගණන කාර්යභාරයක් සඳහාම කාර්යභාර කණ්ඩායමේ සාමාජිකයන් විසින් ඉටුකරන ලද වැඩ සමාලෝචනයට ලක්කිරීම අත්‍යවශ්‍ය වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) තත්ත්වපාලන පද්ධතියක ඕනෑම මූලිකාංග තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) කාර්යභාරයේ යොදවනු ලබන කණ්ඩායමේ සාමාජිකයන් විසින් ඉටුකරනු ලබන වැඩ සමාලෝචනය (reviewing) කිරීම යටතේ තනි කාර්යභාරයක් මත ඇතුළත් කළ හැකි ක්‍රියාකාරකම් දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)
(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## <u>B කොටස</u>

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත ග්‍රීන් ෂිපින් (පෞද්ගලික) සමාගමේ** ජ්‍යෙෂ්ඨ විගණක විසින් පහත සඳහන් කෙටුම්පත් විගණන වාර්තාව පිළියෙල කර ඇත:

**මතය:**

**සීමාසහිත ග්‍රීන් ෂිපින් (පෞද්ගලික) සමාගමේ** 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට සටහන්, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු යන ඒවායින් සමන්විත මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කළෙමු.

**සීමාසහිත ග්‍රීන් ෂිපින් (පෞද්ගලික) සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවලින් 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වයද, එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහයන්ද, කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් නිරූපණය කරන බව අපගේ මතය වේ.

**මූල්‍ය ප්‍රකාශනයන් පිළිබඳ පාලනය භාරව සිටින පුද්ගලයන්ගේ හෝ කළමනාකරණයේ වගකීම්:**

කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ ලෙස මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සමාගමේ කළමනාකාරීත්වයේ වගකීම වන අතර, එකී මූල්‍ය ප්‍රකාශන වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු වීම සඳහා අවශ්‍යයැයි හැඟෙන අභ්‍යන්තර පාලනයන් හඳුන්වා දී භාවිත කිරීමට ද කළමනාකරණය වගකීමෙන් බැඳේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කළමනාකරණය සමාගම ඈවර කිරීමට හෝ මෙහෙයුම් නැවැත්වීමට හෝ එසේ කිරීම ප්‍රායෝගික විකල්පයක් නොමැතිවිට හෝ හැර යෝග්‍ය පරිදි අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් කරුණු සහ ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම පදනම භාවිත කරමින් අඛණ්ඩ පැවැත්ම ලෙස සමාගමට නොකඩවා කරගෙන යාමේ හැකියාවේ තක්සේරුව සඳහා කළමනාකරණය වගකියනු ලැබේ.

සමාගමේ පාලනය භාරව සිටින පුද්ගලයින්ගේ වගකීම වනුයේ සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම වේ.

**අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව:**

2007 අංක 07 දරණ සමාගම් පනතේ අංක 163 (2) වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවයන් පරිදි විගණනය සඳහා අවශ්‍ය වන සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් අප විසින් ලබාගත් අතර, අපගේ පරීක්ෂාවන්වලට අනුව, සමාගම විසින් ගිණුම් වාර්තා නිසිලෙස පවත්වාගෙන ගොස් ඇත.

කොළඹ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත විගණන වාර්තාවේ ඇතුළත් කර **නොමැති** මූලිකාංග පහක්(05) **හඳුනා දක්වන්න**. (ලකුණු 05)

(b) විගණකගේ මතය ගොඩනැංවීමේදී විගණක විසින් සැලකිල්ලට ගතයුතු කරුණු තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(c) විකරණය කළ මත (modified opinion) වර්ග දෙකක්(02) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**රුක්මන් ඇසොසියේට්ස් (RA)** යනු ජ්‍යෙෂ්ඨයන් දෙදෙනෙකු (02) සහ තවත් කණිෂ්ඨ කාර්ය මණ්ඩලයේ පස්(05) දෙනෙකු සමග තනිව පරිචයෙහි නියැලෙන (sole practitioner) ආයතනයකි. 2010 වර්ෂයේ සිටම, **සීමාසහිත HTP ප්‍රේට් සර්විසස් (පෞද්ගලික) සමාගමේ (HTP)** විගණක **RA සමාගම** වේ. 2010 වර්ෂයේ සිටම **HTP සමාගමේ** විගණනයේ විගණන කාර්යභාර හවුල්කරු **රුක්මන් මහතා** වන අතර, පසුගිය වර්ෂ තුන සඳහා මෙම විගණනය භාර ජ්‍යෙෂ්ඨ සාමාජිකයා වූයේ **සමන්ය**. **HTP** සමාගමේ ස්කන්ධ සාධනපත්‍රවල (equity instruments) අගය තක්සේරු කිරීමේ කාර්යභාරය බාරගන්නා ලෙස එම සමාගමේ අධ්‍යක්ෂකවරු විසින් **RA සමාගමෙන්** ඉල්ලා ඇත. **RA සමාගම** විසින් HTP සමාගම වෙත සපයනු ලබන ගිණුම්කරණ සහ වාර්ෂික විගණන සේවාවලින් තම ආදායමෙන් 35% ට ආසන්න ප්‍රමාණයක් උපයාගන්නා බැවින් සේවාදායකයාගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම **රුක්මන් මහතාට** දුෂ්කර වී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) තක්සේරු කිරීමේ කාර්යය (valuation assignment) බාර ගැනීමේදී **රුක්මන් ඇසොසියේට්ස්** විසින් ක්‍රියාත්මක කළ යුතු ආරක්ෂක ක්‍රම (safeguards) තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) ඉහත සඳහන් සිද්ධියට අදාලව **RA සමාගමට** අදාල වන ආචාරධර්මවල මූලික මූලධර්මයන්ට අනුකූලවීමේදී ඇතිවන තර්ජන **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

(A) එක් එක් විගණන කාර්යභාරය සඳහා සැලසුම්කරණය පිළිබඳ ලියවිල්ලක් (planning memorandum) පිළියෙල කළ යුතුය. එවැනි ලියවිල්ලක් පිළියෙල කිරීමේ අරමුණු වන්නේ සැලසුම්කරණ ක්‍රියාවලිය පිළිබඳ විධිමත් වාර්තාවක් සැපයීම සහ සියලුම මට්ටමේ කාර්යයේ නිරත සාමාජිකයන් හට සැලසුම්කරණ තීරණ සන්නිවේදනය කිරීමයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සැලසුම්කරණය පිළිබඳ ලියවිල්ලේ ඇතුළත් කළ යුතු කරුණු හතරක්(04) **හඳුනාගන්න**. (ලකුණු 04)

(B) විගණන ලේඛණගතකරණය යනු ඉටුකරන ලද විගණන ක්‍රියාපටිපාටි, අදාල විගණන සාක්ෂි සහ විගණක විසින් එළඹෙන ලද අවසාන නිගමන පිළිබඳ වාර්තාවයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) වැඩ පත්‍රිකාවල ආකෘතිය සහ අන්තර්ගතය (form and content) කෙරෙහි බලපෑ හැකි කරුණු තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(b) ස්ථාවර විගණන ලිපිගොනුවෙහි ඇතුළත් කරනු ලැබිය හැකි තොරතුරු වර්ග තුනක්(03) **සඳහන් කරන්න**.

(ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

(A) **සිසු උපකාර අරමුදල (SHF)** යනු ආර්ථික අභියෝගයන්ට මුහුණ පා සිටින දරුවන්ට අධ්‍යාපනික ආධාර සලස්වාලීමේ නියැලී සිටින රාජ්‍ය නොවන සංවිධානයකි (NGO). **SHF** හි වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය සඳහා SAP හි උප මොඩියුලයක් පවත්වාගෙන යයි.

2020 මාර්තු 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයේ ව්‍යවස්ථාපිත විගණනය අතරතුරදී, ජ්‍යෙෂ්ඨ විගණක විසින් වැටුප් ගෙවීම් ක්‍රියාවලියට සම්බන්ධ පහත සඳහන් තොරතුරු හඳුනාගෙන තිබේ:

- අධ්‍යක්ෂවරයෙක්, මූල්‍ය හා පරිපාලන කළමනාකරු, මානව සම්පත් (HR) කළමනාකරු, මානව සම්පත් විධායක, ගිණුම් විධායක, ගිණුම් ලිපිකරු සහ සේවකයන් පස් (05) දෙනෙකුගෙන් සංවිධානයේ සංයුතිය සමන්විත වේ.

- වැඩකරන දින ගණන මත පදනම්ව සේවකයන්ට ගෙවීම් කරනු ලැබේ. පැමිණීමේ වාර්තා ලබා ගැනීම සඳහා අතින් අත්සන් කිරීමේ පොත ආරක්ෂක කුටියේ තබා ඇත.

- ආරක්ෂක නිලධාරියාගෙන් ලැබෙන පැමිණීමේ වාර්තා පදනම් කරගෙන ගිණුම් විධායක විසින් මාසික වැටුප් (payroll) ගණනය කරනු ලැබේ.

- වැටුප් ගෙවීමේ මොඩියුලය ගිණුම් ලිපිකරු විසින් යාවත්කාලීන කරනු ලබන අතර, මානව සම්පත් විධායක විසින් අනුමත කරනු ලැබේ. වැටුප් ලේඛන සැසඳීමේ ප්‍රකාශන **SHF** පිළියෙල නොකරයි.

- මූල්‍ය හා පරිපාලන කළමනාකරු විසින් අනුමත කරනු ලබන බැංකු මාරුකිරීම් හරහා අදාල සේවකයන්ගේ බැංකු ගිණුම්වලට මාසික ගෙවීම් කරනු ලැබේ.

- SAP හි බලපත්‍ර පිරිවැය හේතුවෙන් මූල්‍ය දෙපාර්තමේන්තුව සහ මානව සම්පත් දෙපාර්තමේන්තුව යන දෙකටම තනි පරිශීලක පරිගණක පද්ධති ප්‍රවේශයක් (single user login) භාවිත කරනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **SHF** හි ඉහත වැටුප් ක්‍රියාවලියේ ඇති අභ්‍යන්තර පාලන දුර්වලතා තුනක්(03) **හඳුනා දක්වන්න.** (ලකුණු 03)

(b) ඉහත එක් එක් දුර්වලතාවය මැඩ පැවැත්වීම (overcome) සඳහා අදාල වන නිර්දේශය බැගින් **සඳහන් කරන්න**. (ලකුණු 03)

(c) සඵලදායී වැටුප් ගෙවීමේ (payroll) ක්‍රියාවලියක අරමුණු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(d) තොරතුරු පද්ධතිවලට අදාලව **SHF** විසින් ක්‍රියාත්මක කළ යුතුව ඇති තොරතුරු තාක්ෂණ පොදු පාලනයන් (general controls) සඳහා උදාහරණ තුනක්(03) ද, තොරතුරු තාක්ෂණ භාවිත / යෙදුම් පාලන (application controls) සඳහා උදාහරණ දෙකක්(02) ද බැගින් **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 05)

(B) සංවිධානවල අරමුණු සහ ඉලක්ක මුදුන්පත් කර ගැනීමට උපකාරීවීම සඳහා කළමනාකාරිත්වය විසින් හඳුන්වාදෙනු ලබන ක්‍රියාවලින් අභ්‍යන්තර පාලන පද්ධතියක් ලෙස හඳුනාගනු ලැබේ. පාලන පරිසරය, අවදානම් තක්සේරුව, පාලන ක්‍රියාකාරකම්, තොරතුරු හා සන්නිවේදනය සහ අධීක්ෂණය නම් වූ සංරචක පහක් COSO අභ්‍යන්තර පාලන පද්ධති රාමුවේ ඇතුලත් වේ. කෙසේවුවත්, අභ්‍යන්තර පාලනය කෙරෙහි විශ්වාසය තැබීම පිළිබඳ ආවේණික සීමා පවතින නිසා අභ්‍යන්තර පාලනයන් ක්‍රියාත්මක කළද වංචා සහ වැරදි පැවතීමේ අවදානම විගණකට කිසිවිටෙක ඉවත්කල නොහැකිය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) අභ්‍යන්තර පාලන පද්ධතියක අරමුණු දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) පාලන ක්‍රියාකාරකම් හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(c) අභ්‍යන්තර පාලනයේ ආවේණික සීමා හතරක්(04) **හඳුනා දක්වන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

(A) පොසිලෙන් භාණ්ඩ නිෂ්පාදනය කොට දේශීය වෙළෙඳපොලේ විකුණනු ලබන සමාගමක් වන **සීමාසහිත BC (පෞද්ගලික) සමාගමේ** ව්‍යාවස්ථාපිත විගණනය භාර ජ්‍යෙෂ්ඨයා ඔබ වේ. 2020 මාර්තු 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා වන විගණන කාර්යභාරයට අදාල විගණන සැලසුම්කරණ ලියවිල්ලෙන් සහ සම්බන්ධිත වැඩ පත්‍රිකාවලින් පහත සඳහන් විස්තර උපුටා ගන්නා ලදි.

වර්ෂය සඳහා සමාගමේ විකුණුම් ආදායම වන රු. මිලියන 450, ගනුදෙනුකරුවන් හතර දෙනෙකුගෙන් උපයාගෙන තිබුණි. 2020 මාර්තු මාසය සඳහා විකුණුම් සහ ණය කාලය ද ඇතුලත්ව එම ගනුදෙනුකරුවන්ගේ විස්තර පහත සඳහන් පරිදි විය:

| ගනුදෙනුකරු | වර්ෂය සඳහා විකුණුම් (රු. මිලියනවලින්) | ණය කාලය | 2020 මාර්තු මාසය සඳහා විකුණුම් (රු. මිලියනවලින්) |
|---|---|---|---|
| එරෝ සුපර් | 180 | දින 60 | 40 |
| සුපර් ෆුඩ් සිටි | 120 | දින 45 | 10 |
| ආශ්‍රිත සමාගම | 100 | දින 120 | 60 |
| කළමනාකරණ අධ්‍යක්ෂකගේ බිරිඳ | 50 | දින 240 | 40 |

විගණන කණ්ඩායම විසින් ප්‍රමාණාත්මකභාවය මත පදනම්ව වෙළෙඳ ලැබිය යුතු මුදල් සනාථ කර එවීම සඳහා **එරෝ සුපර් සහ සුපර් ෆුඩ් සිටි** තෝරාගන්නා ලදි.

පහත සඳහන් අමතර තොරතුරු ද විගණන කණ්ඩායම විසින් හඳුනාගන්නා ලදි:

- ගනුදෙනුකරුවන්ගේ ඇණවුම්, විකුණුම් විධායක විසින් ලබාගන්නා අතර, විද්‍යුත් තැපැල (email) හරහා ඒවා ඔහු ගිණුම් විධායක වෙත දන්වනු ලබයි. එවිට ගිණුම් විධායක විසින් ඉන්වොයිසියක් ජනනය කරන (raises) අතර, එම අවස්ථාවේදීම අයභාරය (revenue) හඳුනා ගනු ලබයි.
- 2020 මාර්තු 31 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂය රු. මිලියන 180 ක් විය. එය සමන්විත වූයේ කළමනාකරණ අධ්‍යක්ෂකගේ බිරිඳගෙන් රු. මිලියන 50 ක් ද, ආශ්‍රිත සමාගමෙන් රු. මිලියන 80 ක් ද සහ එරෝ සුපර් හි රු. මිලියන 50 ක් ද වශයෙනි.

- සමාගමේ වැඩ පිළිවෙල (arrangement) වන්නේ ගනුදෙනුකරු කර්මාන්තශාලාවෙන් භාණ්ඩ ලබාගෙන භාණ්ඩ ලැබුණු බව ඉන්වොයිසි පිටපතේ සහතික කර පසුව එය ගෙවුගත කිරීම සඳහා මුල්‍ය අංශය වෙත යැවීමය.
- වර්ෂය සඳහා වූ විකුණුම් මත පදනම්ව විකුණුම් කණ්ඩායමට සහ කළමනාකාර අධ්‍යක්ෂකට දිරිගැන්වීමේ දීමනා දෙනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත BC (පෞද්ගලික) සමාගමේ** විගණන ක්‍රියාපටිපාටි ඉටුකිරීමේදී විශේෂ අවධානය යොමුකළ යුතු ක්ෂේත්‍ර හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(b) ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු ගිණුම් ශේෂ හැර විගණක විසින් බාහිර තහවුරු කිරීම් (external confirmations) භාවිත කරනු ලැබිය හැකි අවස්ථා සඳහා උදාහරණ තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(c) පාලන පරීක්ෂා (test of controls) සහ තහවුරු කිරීමේ පටිපාටි (substantive procedures) අතර වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(d) සම්බන්ධිත පාර්ශව (related party) ගනුදෙනු හඳුනා ගැනීමට සහ හෙළිදරව් කර ගැනීම සඳහා වගකිවයුතු පාර්ශවය **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(e) සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සම්බන්ධයෙන් **සීමාසහිත BC (පෞද්ගලික) සමාගමේ** ජ්‍යෙෂ්ඨ විගණක විසින් සලකා බැලිය යුතු අවදානම් (risks) දෙකක්(02) **විස්තර කරන්න.** (ලකුණු 03)

(B) කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගමක් වූ **සීමාසහිත හොප් පොදු සමාගමේ,** 2020 මාර්තු 31 දිනෙන් අවසන් මුල්‍ය වර්ෂය සඳහා වාර්ෂික විගණනය **RMG ඇසෝසියේට්ස්** ආයතනය විසින් සිදුකර ඇත. විගණනය නිමකිරීමේ ලියවිල්ලෙන් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී. පහත සඳහන් සැලකිලිමත් විය යුතු කරුණු (concerns) පිළිබඳව විගණක විසින් ප්‍රධාන මුල්‍ය නිලධාරියා (CFO) සමඟ සාකච්ඡා කරන ලද නමුත් ඒවා සම්බන්ධව මුල්‍ය ප්‍රකාශන ගැලපීමට ඔහු අකමැති විය. මුල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා ඊළඟ සතියේ අනුමත කළ යුතුව තිබේ. විගණනය සැලසුම්කරණ අදියරේදී භාවිත කළ ප්‍රමාණාත්මකභාවය, ආදායම් බදුවලට පෙර ලාභ මත පදනම්ව රු. මිලියන 10 කි.

**විගණනයේදී සැලකිලිමත් වූ කරුණු (concerns) සහ අවප්‍රකාශන (misstatements):**

(1) ගොඩනැගිල්ලේ ක්ෂය රු.200,000/- කින් අඩුවෙන් දක්වා ඇත.

(2) 2020 මාර්තු මාසය සඳහා විදුලිය සහ ජල ගාස්තුව වන රු. මිලියනයක් උපචිත වියදම් ලෙස වාර්තාකරන දිනට ගිණුම් පොත්වල ඇතුළත් කර නොමැත.

(3) සමාගමේ නව කර්මාන්තශාලාව ඉදිකිරීමෙන් පසු, සමාගම විසින් දරණ ලද රු. මිලියන 25 ක ණය පිරිවැය කර්මාන්තශාලා ගොඩනැගිල්ල ඉදිකිරීමේ පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ප්‍රමාණාත්මකභාවය පිළිබඳ තක්සේරුව විගණකට වැදගත් වන්නේ කුමක් නිසාදැයි යන්නට හේතු තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) විගණනය කෙරෙහි ඉහත දැක්වූ අවප්‍රකාශනවල (misstatements) තනි තනි බලපෑම සහ සමස්ත බලපෑම **විමසන්න**. (ලකුණු 07)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# <u>කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව</u>

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අදින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |